3 දකුණු ආසියාව

දකුණු ආසියා කලාපයේ
පිහිටීම හා භූ දර්ශනය පිළිබඳ
අධ්‍යයනය කිරීම මෙම ඒකකයෙන්
බලාපොරොත්තු වේ.

අප ජීවත් වන දකුණු ආසියා ප්‍රදේශය සුවිශේෂී භූගෝලීය කලාපයකි. මෙහි පවතින භෞතික හා මානුෂ භූගෝල විද්‍යාත්මක ලක්ෂණවල අනන්‍යතාව හේතුකොට ගෙන වෙනත් භූගෝලීය කලාපවලින් වෙන් කර හඳුනාගත හැකි ය. මුහුදු මට්ටමේ පිහිටි සුන්දරබාන් වගුරු බිම මෙන් ම ලොව ඉහළ ම උන්නතාංශය දක්වන එවරට්ස් කඳු මුදුන ද මෙම කලාපයේ පිහිටීම, භූ විෂමතාවෙහි විවිධත්වය විදහා දක්වයි. අධික ශීතල ප්‍රදේශ මෙන් ම අධික උෂ්ණත්වයක් ඇති ප්‍රදේශ ද, ඝන වනාන්තරවල සිට තෘණ භූමි ප්‍රදේශ දක්වා වෙනස් වන වෘක්ෂලතා ද, මෙහි දේශගුණය හා වෘක්ෂලතාවල විවිධත්වය පිළිබිඹු කරයි. ඒ නිසා ම මෙම කලාපය තුළ මානුෂ ක්‍රියාකාරකම්වල ද කැපී පෙනෙන විවිධත්වයක් දක්නට ලැබේ.



3.1 සිතියම : දකුණු ආසියා කලාපයේ සාපේක්ෂ පිහිටීම
මූලාශ්‍රය : ගුණසේන පිලිප් ලෝක සිතියම් පොත (2003) ඇසුරින් සකස් කරන ලදි.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ඉහත 3.1 සිතියම මගින් දකුණු ආසියා කලාපයේ සාපේක්ෂ පිහිටීම හඳුනාගනිමු. දකුණු ආසියාව, උතුරින් හිමාලය කඳු පන්තියෙන් ද, දකුණින් ඉන්දියන් සාගරයෙන් ද, නැගෙනහිරින් බෙංගාල බොක්කෙන් ද, බටහිරින් අරාබි මුහුදින් ද, එය මායිම් වී ඇත.

3.2 සිතියම අධ්‍යයනය කිරීමෙන් දකුණු ආසියා කලාපයේ නිරපේක්ෂ පිහිටීම හඳුනාගනිමු. සිතියමට අනුව දළ වශයෙන් සමකයේ සිට (අක්ෂාංශ 0^{0}) - උතුරු අක්ෂාංශ 38^{0} දක්වාත් නැගෙනහිර දේශාංශ 60^{0}-100^{0} දක්වාත් පාරාසයක එය විහිදේ. සමස්ත පෘථිවි තලයෙන් 3%ක භූමි ප්‍රදේශයක් මෙම කලාපයට අයත් වේ.

දකුණු ආසියා කලාපයට ඉන්දියාව, පාකිස්ථානය, නේපාලය, බංග්ලාදේශය, භූතානය, මාලදිවයින් හා ශ්‍රී ලංකාව අයත් වේ. නිකොබාර් දූපත් හා අන්දමන් දූපත් ද දකුණු ආසියානු භූගෝලීය ප්‍රදේශයට අයත් වේ. දකුණු ආසියා කලාපයේ පිහිටුවා ඇති දේශපාලන සංවිධානයක් වන සාර්ක් සංවිධානයට ඇෆ්ගනිස්ථානය ඇතුළු කර ඇතත් එය භූගෝලීය වශයෙන් අයත් වන්නේ මධ්‍යම ආසියාවටයි.

3.2 සිතියම : දකුණු ආසියා කලාපයේ නිරපේක්ෂ පිහිටීම

මූලාශ්‍රය : ගුණසේන පිලිප් ලෝක සිතියම් පොත (2003) ඇසුරින් සකස් කරන ලදි.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.



3.3 සිතියම : දකුණු ආසියානු රටවල්, අගනගර හා ජාතික කොඩි

සමකයට උතුරින් පිහිටා ඇති දකුණු ආසියා කලාපයේ පවතින්නේ නිවර්තන දේශගුණයකි. මෙම කලාපයේ සමහර රටවල් දිගු වෙරළ තීරයකින් වට වී ඇති අතර නේපාලය හා භූතානයට වෙරළ තීරයක් හිමි නැත.

ක්‍රියාකාරකම්

01. දකුණු ආසියාව සුවිශේෂී භූගෝලීය කලාපයක් වීමට හේතු 2ක් සඳහන් කරන්න.

02. A. දකුණු ආසියා කලාපීය සිතියමක් පිටපත් කරගෙන දකුණු ආසියානු රටවල් ලකුණු කර නම් කරන්න.

B. එම රටවල අගනුවර ලකුණු කර නම් කරන්න.

C. දකුණු ආසියා කලාපයට මායිම් වූ රටවල් 4ක් සඳහන් කරන්න.

D. දකුණු ආසියා කලාපයේ විශාලතම රට කුමක් ද?

දකුණු ආසියානු කලාපයේ භූ දර්ශනය

දකුණු ආසියා කලාපීය භූ දර්ශනය තුළ භෞතික මෙන් ම මානුෂ ක්‍රියාකාරකම්වල විවිධත්වයක් දක්නට ඇත. මෙහි විවිධ වූ භූ දර්ශනයන් හැදෑරීමේ දී එහි ඇති සුවිශේෂී ලක්ෂණ මුල්කරගෙන කොටස් 6කට බෙදා අධ්‍යයනය කළ හැකි ය.

භූ දර්ශනය යනු යම්කිසි ප්‍රදේශයක භෞතික පරිසරය හා ඒ මත ගොඩ නැගුණු මිනිස් ක්‍රියාකාරකම් මගින් නිර්මාණය වූ සමස්ත භූ දර්ශනයයි.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

I කඳුකර භූ දර්ශනය



II නිම්න භූ දර්ශනය

III වෙරළ බඩ භූ දර්ශනය

IV ග්‍රාමීය භූ දර්ශනය

V කාර්මික හා නාගරික භූ දර්ශනය

VI කාන්තාර භූ දර්ශනය

3.1 රූපය : දකුණු ආසියා කලාපයේ විවිධ වූ භූ දර්ශන

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

කඳුකර භූ දර්ශනය

දකුණු ආසියා කලාපයේ මාලදිවයින් හැර අනෙක් සෑම රටකම කඳුකර භූ දර්ශනයට අයත් ලක්ෂණ දක්නට ඇත. ඉන්දියාව, පාකිස්ථානය, ශ්‍රී ලංකාව වැනි රටවල විවිධ උසකින් යුතු කඳු පන්තීන් දක්නට ඇති අතර ඒවායේ විවිධාකාර භූ දර්ශන දැක ගත හැකි ය.

ඉන්දියාව	: හිමාලය වැටිය
පාකිස්ථානය	: හින්දුකුෂ්, සුලෙයිමාන් වැටි
ශ්‍රී ලංකාව	: මධ්‍යම කඳුකරය ඊට උදාහරණ වේ.

මේ අතරින් හිමාලය කඳුකරයේ භූ දර්ශනය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පාඩමේ අරමුණයි.



3.4 සිතියම : හිමාලය කඳු පද්ධතිය

මූලාශ්‍රය : ගුණසේන ෆිලිප් ලෝක සිතියම් පොත (2003) ඇසුරින් සකස් කරන ලදි.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

හිමාලය කඳු වැටිය භූ දර්ශනයේ විවිධ භෞතික ලක්ෂණ පෙන්නුම් කරයි. මේ භෞතික භූ ලක්ෂණය මත ඊට ම සුවිශේෂී වූ මානුෂ භූ දර්ශනයක් ද ගොඩනැගී ඇත.

මහා හිමාලය වැටියට කුන්ලුන්ෂාන් හිමාලය සහ කාරකෝරම් කඳුවැටි අයත්වේ. (3.4 සිතියම) මෙහි කඳු, නෙරු, ගැඹුරු ගංදොරු, දූර්ග, උස්බිම්, සානු සහ කපොලු ආදිය දක්නට ලැබේ. මෙම කඳු පන්තිය මුහුදු මට්ටමේ සිට මීටර් 8000ක් පමණ උසකට සහ දිගින් කි.මී 2500ක් තරම් ප්‍රදේශයක පැතිර ඇත. ලොව උස ම කඳු මුදුන් 14න් 9ක් ම මෙම භූ දර්ශනය තුළ දැකිය හැකි වේ.

හිමාලය කඳු පන්තියේ දේශගුණය ගත්විට සමක දේශගුණයේ සිට ධ්‍රැව දේශගුණය දක්වා විවිධ දේශගුණික ලක්ෂණ පෙන්නුම් කරයි. මෙම කඳුකර භූ දර්ශනයේ උන්නතාංශය වැඩි වන විට ශිත වන අතර උන්නතාංශය අඩු වන විට තෙත් ගතිය වැඩි ය. එය තුළ හිම මිදුණ එවරස්ට් කඳු මුදුන මෙන් ම උණුසුම් දේශගුණික ලක්ෂණ ඇති නේපාලයේ ටෙරායි නිම්නය වැනි ප්‍රදේශ ඇත. උන්නතාංශය අනුව දේශගුණය ද වෙනස් වේ. කඳුවලින් වට වූ ප්‍රදේශවල වියළි දේශගුණික ලක්ෂණ පෙන්නුම් කරයි. විශාල පරාසයක පැතිරුණු ශාක හා සත්ත්ව විශේෂ ද හඳුනාගත හැකි ය.

හිමාලය කඳුකරයේ මොංගොලොයිඩ් ජන වර්ගයට අයත් ගෝත්‍රික ජන වර්ග කිහිපයක් වාසය කරයි. භූටියා (Bhutia), කසා (Khasa), දරඩ් (Darad), ලෙප්චා (Lepcha), ෂෙර්පා (Sherpa) වැනි අය මේ අතරින් වැදගත් වේ. මෙම කඳුකර භූ දර්ශනය තුළ විවිධ ආගම් හා විවිධ සංස්කෘතීන් ද ඇත. හිම සහිත කඳුකර ප්‍රදේශවලට ආවේණික ජීවන රටාවක් හා විනෝදාත්මක කටයුතු ඇත. කඳු නැගීම, හිම ක්‍රීඩාව හා සංචාරක කර්මාන්තය මෙහි දී කැපී පෙනේ. ජීවන රටාව මෙන් ම මිනිසුන්ගේ ශරීර ස්වභාවය ද කඳුකර පරිසරයට අනුව හැඩ ගැසී ඇත. කඳු නැගීමට හැකි වන ලෙස ශක්තිමත් ව පිහිටි පැතලි, පුළුල් පතුල් සහිත පාද, බර ඉසලීමට හැකි ලෙස ශක්තිමත් වූ බාහු සහ අඩු ඔක්සිජන් වායුවෙන් ජීවත් වීමට හැකි අයුරින් සකස් වූ පෙනහළු ද පිහිටා තිබීම මොවුන්ගේ විශේෂ ශාරීරික ලක්ෂණ වේ.

කෘෂිකර්මාන්තය හා සත්ව පාලනය ප්‍රධාන ජීවන රටා වේ. කඳු අතර පහත් බිම්වල හෙල්මළු වගාව සිදු කරන අතර කඳු ආශ්‍රිත ප්‍රදේශවල ගවයන් හා බැටළුවන් ඇති කරයි. කඳු නගින අයට මග පෙන් වීම භාණ්ඩ අලෙවි කිරීම හා බර උසුලාගෙන යාම වැනි සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියා ද කරනු ලැබේ. කාන්තාවෝ රෙදි විවීම, නූල් ගෙතීම වැනි රැකියාවල නිරත වෙති.

3.2 රූපය : කඳුකර භූ දර්ශනයේ පැතිකඩක්

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

කඳුකර පරිසරයෙන් සොයාගත හැකි ගල් ලී කූඩු, මැටි, ලී දඬු උපයෝගි කොටගෙන නිවාස ඉදිකර ඇත. වහලය සෙවිලි කිරීම සඳහා තෘණ විශේෂ භාවිත කරයි. නිවාස සෑදීමේ දී භූ විෂමතාවට හා දේශගුණයට ඔරොත්තු දෙන අයුරින් සකස් කර ඇත. මොවුහු එකම ස්ථානයක නිවාස තැනීමට විශේෂ කැමැත්තක් දක්වති. කඳුකර සංචරණ සත්ත්ව පාලනය කරන අය තාවකාලික නිවාසවල ගත කරමින් තැනින් තැනට ගමන් කරති.

වී, තිරිඟු, ඉරිඟු, මුං ඇට, මිලට්, ධාන්‍ය සහ එළවලු කෘෂිකාර්මික බෝග අතර ප්‍රධාන වේ. වනාන්තරයේ වැවෙන අල වර්ග, මී පැණි හා සතුන් දඩයම මගින් ලබාගන්නා මස් වර්ග ආහාරයට ගන්නා අතර ඒවා අලෙවියෙන් මුදල් ලබා ගැනේ.

ක්‍රියාකාරකම

පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

හිමාල කඳුකරයේ භූ විෂමතා ලක්ෂණ	ජීවත් වන ජන වර්ග	මිනිසුන්ගේ ආහාර	රැකියා	වගාවන්

නිම්න භූ දර්ශනය

කඳුකර භූ දර්ශනයට වඩා බොහෝ සේ වෙනස් භූ දර්ශනයක් නිම්න ආශ්‍රිත ව දැකිය හැකි ය. දකුණු ආසියා කලාපයේ සුවිශේෂී නිම්න භූ දර්ශන ලෙස,

- ඉන්දියාවේ : ගංගා නම් නිම්නය
- පාකිස්ථානයේ : සින්ධු නිම්නය
- ශ්‍රී ලංකාවේ : මහවැලි සහ කැලණි ගං නිම්න

ආදිය දැක්විය හැකි ය.

3.5 සිතියම : ගංගා නම් නිම්නය

මූලාශ්‍රය : *http://files.prokerala.com/maps/india/*

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මේ අතරින් අපේ අවධානය යොමු කරනු ලබන්නේ මෙම කලාපයේ විශාලතම ගංගා නිම්නය වන ගංගා නම් ගඟ ආශ්‍රිත භූ දර්ශනය පිළිබඳව ය. (3.6 සිතියම) හිමාලය කඳුකරයෙන් ආරම්භ වන ගංගා නම් ගඟ කි.මී 2510ක් පමණ දුර ගෙවා බෙංගාල බොක්කට ගලා බසී. මෙම ගංගාවේ නිම්නය දෙපස විවිධ වූ භූ දර්ශන දැකිය හැකි ය.

3.3 රූපය : ගංගා නම් ගඟ ආශ්‍රිත භූ දර්ශනය

ගංගා නම් ගං නිම්නයේ ආරම්භක අවස්ථාව කඳුකර භූ දර්ශනයට අයත් වේ. මධ්‍යම හා පහළ නිම්නවල ඊට ආවේණික භෞතික ලක්ෂණ හා මානුෂ ක්‍රියාකාරකම් දක්නට ඇත. මෙම ගඟ දිගේ පහළට ගමන් කරන විට විවිධ භූ රූප දක්නට ලැබේ. රැළිබිම්, හැඩපළු ගංගා ගං දඟර, තැනිබිම්, පිටාර තැනි, වැලිතලා හා පළල් ගංගා නිම්න ඒ අතර වැදගත් වේ.

මෙම තැනිතලා ප්‍රදේශයේ රැළි බිම් ලක්ෂණ වැඩි පුර දක්නට ඇති අතර මීටර් 200ට වැඩි උස්බිම් ඇත්තේ කලාතුරකිනි.

හින්දු, බෞද්ධ හා වෙනත් ආගම්වල පූජනීය ස්ථාන රාශියක් මෙම ගංගා නිම්නයේ පිහිටා ඇත. හින්දු බැතිමතුන්ගේ ශුද්ධ වූ ගංගා නදිය වන්නේ මෙයයි. විවිධ භාෂා කතා කරන විවිධ ආගම් අදහන ජනයා මෙම ප්‍රදේශයේ වාසය කිරීමෙන් සුවිශේෂී සංස්කෘතික භූ දර්ශනයක් බිහි වී තිබේ.

3.4 රූපය : ගංගා නිම්නය ආශ්‍රිත සුවිශේෂී සංස්කෘතික භූ දර්ශනයක්

මෙම නිම්නය තුළ දැකිය හැකි ප්‍රධානතම මානුෂ ක්‍රියාකාරකම කෘෂිකර්මයයි. සාරවත් දියළු පසක් පවතින ගංගා නිම්නය පුරා විවිධ කෘෂි භෝග වගා කරනු ලැබේ. වී, තිරිඟු හා උක් ඒ අතර ප්‍රධාන වේ. දේශගුණයේ පවතින අන්තගාමී තත්ත්වයන් මෙම ප්‍රදේශයේ වගාවට බලපාන අතර ඒ ඒ පරිසර තත්ත්වයන්ට අනුව භෝග වගාව හැඩ ගැසී ඇත. සමහර ප්‍රදේශවල ගැඹුරු ළිං මගින් ජල සම්පාදනය කර ගනිමින් කපු, උක් වැනි කාර්මික භෝග වගා කෙරෙයි.

මධ්‍යම ගංගා නිම්න ප්‍රදේශයේ විශාල වශයෙන් පැතිරුණු වී, තිරිඟු වගා බිම් ඇති අතර ඉන් ඉහළ අස්වැන්නක් ලැබේ. ගංගා නදියේ පහළ ඩෙල්ටා ප්‍රදේශයේ පිහිටි බංගලා දේශයේ සුන්දරබාන් වගුරු බිම ආශ්‍රිත ව ප්‍රධාන වගාව ජුට් ය. ජුට් වගාව 'රන් කෙඳි' යන නාමයෙන් හැඳින්වීමෙන් පෙනී යන්නේ එහි වැදගත්කමයි.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මෙම ප්‍රදේශයේ අධික ජන සංඛ්‍යාවක් වාසය කරති. එම නිසා සපයා ගත හැකි ලාභ ශ්‍රමය යොදා ගනිමින් කෘෂි කර්මාන්තය හා අනෙකුත් කර්මාන්ත දියුණු වී ඇත. එමෙන් ම දිල්ලිය, පැට්නා, අග්‍රා, වරානසි, කොල්කටා, ඩැකා ආදි ප්‍රධාන නගර ආශ්‍රිත ව කර්මාන්ත ව්‍යාප්තව ඇත.

මෙම නිම්නය තුළ ජන ඝනත්වය ද අධික ය. දිල්ලිය, කාන්පූර්, පැට්නා සහ කොල්කටා එවැනි ජනාධික නගර වේ. මෙම ප්‍රදේශය පුරා පැතිරුණු මාර්ග ජාලයක් ද දක්නට ඇත. මගී හා භාණ්ඩ ප්‍රවාහනයේ දී බස්රථ, දුම්රිය හා ලොරි රථ බහුල ලෙස යොදා ගනී. මෙම ප්‍රදේශය පුරා ව්‍යාප්ත වුණු විශාල වාණිජ මධ්‍යස්ථාන රාශියක් දක්නට ඇත. ආග්‍රා සිට පැට්නා දක්වා ගමන් කරන්නෙකුට මේ භූ දර්ශනයේ විචිත්‍ර බව දැක ගත හැකි ය.

ගංගා නම් ගඟේ සමස්ත භූ දර්ශනය තුළ ඉහළ ගංගා නිම්නයේ ඝන වැසි වනාන්තර දක්නට ඇති අතර අඩු ජන සංඛ්‍යාවක් ඇත. මධ්‍යම ගංගා නිම්නයේ අධික ජන සංඛ්‍යාවක් වාසය කරන අතර වී හා තිරිඟු ප්‍රධාන වගාවන් වේ. පහළ ගංගා නිම්නයේ අධික ජන පීඩනයක් පවතින අතර ජලය අපවිත්‍ර වීම හා ජල ගැලීම්වලට භාජනය වීමෙන් පීඩාකාරී පරිසරයක් නිර්මාණය වී තිබේ.

ක්‍රියාකාරකම්

01. සිතියම් පොතක් භාවිතයෙන් දකුණු ආසියා කලාපයේ සිතියමක ගංගා නම් ගඟ ඇඳ එහි අතු ගංගා ලකුණු කර නම් කරන්න.
02. ගංගා නම් ගං නිම්න භූ දර්ශනය හිමාලය කඳුකර භූ දර්ශනයෙන් වෙනස් වන්නේ කෙසේ දැයි කරුණු 3ක් ඇසුරින් පැහැදිලි කරන්න.



වෙරළබඩ භූ දර්ශනය

දකුණු ආසියාව දිගු වෙරළ තීරයක් හිමි කලාපයකි. එම කලාපයේ නේපාලය, භූතානය හැරුණු විට අනෙක් සෑම රටකට ම වෙරළ තීරයක් හිමි ය. ශ්‍රී ලංකාව දූපත් රාජ්‍යයක් බැවින් රට වටා ම වෙරළ තීරයක් ඇත. මේ අතරින් ශ්‍රී ලංකාව හා මාලදිවයින් රාජ්‍යයවල වෙරළබඩ භූ දර්ශනය කැපී පෙනේ.

වෙරළබඩ භූ දර්ශනයේ කැපී පෙනෙන භෞතික ලක්ෂණ අතර, වැලිපර, කලපු, බොකු, තුඩු, කොරල්පර, කඩොලාන ආදිය දැකිය හැකි වේ. මාලදිවයින් රාජ්‍යය කොරල්පර හා අතොළුවලින් සැදි දූපත් 1200කට වැඩි සංඛ්‍යාවකින් සමන්විත ය. මේවා අතරින් දූපත් 200ක පමණ ජනයා වාසය කරති.

ධීවර කර්මාන්තය හා සංචාරක ව්‍යාපාරය වෙරළබඩ භූ දර්ශනයේ කැපී පෙනෙන ආර්ථික කටයුතු වේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ශ්‍රී ලංකාව හා මාල දිවයින් රාජ්‍යවල වෙරළ තීරයේ ඇති කඩතොළු සහිත බව හා නොගැඹුරු පටු මුහුදු තීරය ධීවර කටයුතුවලට සුදුසු පසුබිමක් නිර්මාණය කරයි.

3.5 රූපය : ධීවර කර්මාන්තය ආශ්‍රිත මානුෂ ක්‍රියාකාරකම්

ධීවර කටයුතු ආශ්‍රිත ධීවර වරාය සංවර්ධනය වී ඇති අතර ඒ ආශ්‍රිත නගර හා ගම්මාන සංවර්ධනය වී ඇත.

මෑත කාලයේ මෙම කලාපවල සංචාරක කර්මාන්තය ද දියුණුවෙමින් පවතී. මාලදිවයිනේ සංචාරක ව්‍යාපාරයට වෙන් වූ දූපත් රාශියක් ඇත. මෙම කලාපයේ සංචාරක කර්මාන්තය දියුණු වීමට පහත සඳහන් සාධක බලපා ඇත.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

3.6 රූපය : වෙරළ තීරයේ විවිධ සංචාරක ආකර්ෂණ

ශ්‍රී ලංකාව වටා මුහුදු වෙරළේ සංචාරක කර්මාන්තය ව්‍යාප්තව පවතී. විශේෂ සංචාරක ආකර්ෂණ කලාප ලෙස ශ්‍රී ලංකාවේ දක්ෂිණ මුහුදු තීරය හා නැගෙනහිර වෙරළ තීරය වැනි ප්‍රදේශ වැදගත් වේ. ශ්‍රී ලංකාව වටා අනෙකුත් ප්‍රදේශවල ද සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට පහසුකම් සලසා තිබේ. සංචාරක ප්‍රදේශය ආශ්‍රිත රැකියා රාශියක් බිහි වී ඇත.

- හෝටල් ආශ්‍රිත රැකියා
- විසිතුරු භාණ්ඩ අලෙවිය
- ආයුර්වේද මධ්‍යස්ථාන
- සංචාරක මග පෙන්වන්නන්
- වෙළෙඳාම්
- වරාය ආශ්‍රිත රැකියා

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

වෙරළ තීරය ආශ්‍රිත නගර රාශියක් බිහි වී ඇත. කොළඹ, ගාල්ල, මීගමුව, ත්‍රිකුණාමලය හා හම්බන්තොට ඊට නිදසුන් වේ.

වෙරළ භූ දර්ශනය තුළ ජෛව විවිධත්වය ඉහළ මට්ටමක පවතී. කඩොලාන, තෙත් බිම් සහ වගුරු ඒ අතර සුවිශේෂී පරිසර පද්ධති වේ. එම පරිසරය තුළ ශාක විශේෂ උරග, පක්ෂි විශේෂ හා මත්ස්‍ය විශේෂ ආදියේ විවිධත්වයක් දක්නට ඇත.

3.7 රූපය : වෙරළබඩ භූ දර්ශනයේ ජෛව විවිධත්වය

වෙරළ පරිසරය ඉතා ම සංවේදී කලාපයක් වේ. මෙම ප්‍රදේශවල අනවසර ඉදි කිරීම් හිරි ගල් කැඩීම වැනි මානුෂ ක්‍රියාකාරකම් මගින් විවිධ පාරිසරික ගැටලු ඇති වේ. වෙරළ ඛාදනය, පරිසර දූෂණය මෙන් ම විවිධ අපචාර ක්‍රියා වැඩි වීම ද මෙම අහිතකර මානුෂ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයන් ය.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ක්‍රියාකාරකම්

01. දකුණු ආසියා කලාපීය සිතියමක වෙරළ පරිසර භූ දර්ශනයේ වැදගත් ස්ථාන ලකුණු කර නම් කරන්න. (මාලදිවයින, සුන්දරබාන් වගුරුබිම, හික්කඩුව)

02. වෙරළ භූ දර්ශනයේ කැපී පෙනෙන භෞතික ලක්ෂණ මොනවා ද?

03. සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ව දියුණු වී ඇති කර්මාන්ත දෙකක් ද, ධීවර කර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත දෙකක් ද, සඳහන් කරන්න.

04. වෙරළබඩ භූ ලක්ෂණ කෙරෙහි අහිතකර ලෙස බලපාන මානුෂ ක්‍රියාකාරකම් තුනක් නම් කරන්න.

ග්‍රාමීය භූ දර්ශනය

දකුණු ආසියාවේ බහුල ව ම දක්නට ඇත්තේ ග්‍රාමීය භූ දර්ශනයයි. ශ්‍රී ලංකාවේ වියළි කලාපය ග්‍රාමීය භූ දර්ශනයට හොඳම නිදර්ශනයකි. කෘෂිකර්මාන්තය හා ධීවර කර්මාන්තය පදනම් කරගත් මෙම භූ දර්ශනය තුළ ජන ඝනත්වය අඩු ය. ජනාවාස විවිධ රටා අනුව හැඩ ගැසී ඇත. කෘෂිකාර්මික නිෂ්පාදන පදනම් කර ගත් කර්මාන්ත ද දැක ගත හැකි ය. වියළි කලාපය වැලිබිම් සහිත විශාල තැනිතලාවකි. මෙහි ගංගා රාශියක් දැකිය හැකි ය.

කෘෂිකර්මාන්තය මෙහි ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකමයි. වැව කේන්ද්‍ර කරගනිමින් ගම නිර්මාණය වී ඇති අතර වී වගාව ප්‍රධාන ආර්ථික භෝගය වේ. රටේ මුළු සහල් නිෂ්පාදිතයෙන් වැඩි ප්‍රමාණයක් නිපදවනු ලබන්නේ ද මෙම කලාපයේ ය.

3.8 රූපය : වියළි කලාපීය ග්‍රාමීය භූ දර්ශනයේ පැතිකඩක්

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

වී වගාව සිදු කළ නොහැකි උස් බිම්වල හේන් වගා කෙරේ. හේන ග්‍රාමීය භූ දර්ශනයේ සුවිශේෂී ලක්ෂණයක් වන අතර හේන්වල ධාන්‍ය වර්ග, එළවළු, පලතුරු ආදිය වගා කරනු ලැබේ. මීට අමතර ව සත්ත්ව පාලන කටයුතු ද ව්‍යාප්තව පවතී. ගවයා කිරි ආහාර ලබා ගැනීම සඳහාත්, ගොවිතැන් කටයුතු සඳහාත් යොදා ගැනේ.

3.9 රූපය : හේනක දර්ශනයක්

ග්‍රාමීය ආර්ථිකය ඇති ප්‍රදේශවල වාරිමාර්ග කටයුතු හා ජල සම්පාදන ව්‍යාපාර ආශ්‍රිත සැලසුම් සහගත නගර ඉදිවීම මගින් පවතින ග්‍රාමීය භූ දර්ශනයෙ වෙනස් වෙමින් පවතී. ගල් ඔය, උඩවලව, මහඔය වැනි සංවර්ධන ව්‍යාපාර අරඹා ඇත්තේ වියළි කලාපයේ ය.

පාරම්පරික සමාජ සංස්කෘතික ලක්ෂණ නොවෙනස්ව පවතින මෙම කලාපය තුළ ආදිවාසි ජනයා ද ජීවත් වෙති. ශ්‍රී ලංකාවේ අනුරාධපුරය, පොළොන්නරුව වැනි පෞරාණික නගර රාශියක් ද මෙම කලාපය තුළ පිහිටා ඇත.

ක්‍රියාකාරකම්

01. ග්‍රාමීය භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

02. ග්‍රාමීය භූ දර්ශනය වෙනස් වෙමින් පවතී. එයට හේතු දෙකක් දක්වන්න.

කාර්මික හා නාගරික භූ දර්ශනය

දකුණු ආසියා කලාපයේ භෞතික භූ දර්ශනය තුළ කාර්මික හා වාණිජ ක්‍රියාකාරකම් ආශ්‍රිත නාගරික භූ දර්ශන නිර්මාණය වී ඇත. මෙම ප්‍රදේශය තුළ මිනිසා විසින් ඉදිකරන ලද මාර්ග ජාල, සන්නිවේදන ජාල, වාසස්ථාන සහ පරිපාලන මධ්‍යස්ථාන ඉදිකළ ප්‍රදේශ බහුල ය. මේ පහසුකම් නිසා ජනයා නගර කරා සංකේන්ද්‍රණය වී ඇත. මෙසේ නගරවල ජනයා වැඩි වෙත් ම සේවා පහසුකම් සැපයීමෙන් නගර තව තවත් වර්ධනය වේ. දකුණු ආසියාවේ මුම්බායි, දිල්ලිය, චෙන්නායි, කොල්කටා, ඉස්ලාමාබාද්, කරච්චිය හා කොළඹ මෙවැනි නගර වේ.

කාර්මික හා නාගරික භූ දර්ශනය පිළිබඳ අධ්‍යයනය කිරීමට ඉන්දියාවේ මුම්බායි නගරය තෝරා ගනිමු.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

- නිවාස සනත්වය අධික ය. බොහෝ විට සිරස් ව ව්‍යාප්ත ඇත (තට්ටු නිවාස සංකීර්ණ).
- වෙරළබඩ තැනිතලා ප්‍රදේශයක පිහිටි මුම්බායි නගරය ස්වාභාවික වරායක් ලෙස වර්ධනය වූ නගරයකි. මෙය ඉන්දියාවේ දෙවැනි විශාලතම නගරය වේ.
- අතිශයින් සීමිත වූ භූමි ප්‍රමාණයක අධික ජන සංඛ්‍යාවක් වාසය කරති.
- කර්මාන්ත හා සේවා කටයුතු වර්ධනය වී තිබේ.

3.10 රූපය : බුම්බායි නගරයේ දර්ශනයක්

- නිවාස සනත්වය අධික ය. බොහෝ විට සිරස් ව ව්‍යාප්ත ඇත (තට්ටු නිවාස සංකීර්ණ).
- සැලස්මකින් තොර ව ඉදි වූ අඩු පහසුකම් සහිත ජනාවාස විශාල වශයෙන් ඇත.
- මිනිසුන්ගේ දෛනික සංචලතාව ඉතා අධික ය.

එසේ ම ලෝකයේ දෙවැනි විශාලතම සිනමා කර්මාන්තය පිහිටි ස්ථානය වන්නේ ද මුම්බායි නගරයයි. ඇමෙරිකාවේ හොලිවුඩ් පුරයට පමණක් දෙවැනි වන මෙය "බොලිවුඩ්" නමින් ලොව ප්‍රචලිත ය.

3.11 රූපය : මුම්බායි නාගරික භූ දර්ශනයේ විවිධ පැතිකඩ

මෙම ප්‍රදේශයේ ඇති තැනිතලා බව නගරය වර්ධනයට රුකුලක් වී ඇත. ඩෙකාන් කළු පස් තීරය ආසන්නයේ පිහිටා ඇති මේ නගරය මුල් කාලයේ දී කපු කර්මාන්තය ආශ්‍රිත වෙළෙඳ පොළක් ලෙස වර්ධනය විය.

දකුණු ආසියාවේ නාගරික භූ දර්ශනය තුළ විවිධ ගැටලු පවතී. මුම්බායි නගරය තුළ ද මෙම ගැටලු ඇත.

- ඉඩම් හිඟය
- මාර්ග තදබදය
- අඩු ආදායම් ජනාවාස බහුල වීම
- වීදි ජනයා බහුල වීම
- පරිසර දූෂණය
- අපචාර බහුල වීම

මෙම නගරයේ ද දක්නට ඇත. මෙවැනි ගැටලු බහුල වුවත් නගරය තුළ අධ්‍යාපන හා සේවා පහසුකම් බහුල වන අතර විවේකය හා විනෝදය සඳහා ජනයා ඇදී එම ද බහුල වේ. ඒ සඳහා සේවා පහසුකම් ද සපයා ඇත.

ක්‍රියාකාරකම්

01. දකුණු ආසියා කලාපීය සිතියමක කාර්මික හා නාගරික භූ දර්ශනයට උදාහරණ වන නගර පහක් ලකුණු කර නම් කරන්න.

02. මුම්බායි නගරයේ නාගරික භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

03. නාගරික භූ දර්ශනය තුළ මතු ව ඇති ගැටලු හතරක් සඳහන් කරන්න.

කාන්තාර භූ දර්ශනය

දකුණු ආසියා කලාපයේ කාන්තාර භූ දර්ශනයේ දී තාර් කාන්තාර භූ දර්ශනය දෙස අවධානය යොමු කෙරේ.

ඉන්දු, පාකිස්ථාන් දේශ සීමාවේ රාජස්ථාන් ප්‍රාන්තයේ පිහිටා ඇති තාර් කාන්තාරය දකුණු ආසියානු භූ දර්ශනයේ කැපී පෙනන ලක්ෂණයකි.

- වැලිතලා සහිත පැතුරුණු භූමිය
- මිලිමීටර් 250ට අඩු වර්ෂාව
- අධික වාෂ්පීකරණයක් පැවතීම
- අධික උෂ්ණත්වයක් පැවතීම

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

- දැඩි උෂ්ණත්වය නිසා පවත්නා වියළි සුළං
- පසේ තෙතමනය ඉතා අඩු වීම

මෙම කාන්තාර භූ දර්ශනයේ භෞතික ලක්ෂණ කිහිපයකි. තාර් කාන්තාරය විශාල වශයෙන් පැතිරුණු භූගත ජල ධරයක් ඇති ප්‍රදේශයකි. එම නිසා සමහර ශාක වර්ග පොළවේ ගැඹුරට මුල් විහිදුවමින් ජලය උරාගනී. මිනිසුන් භූගත ජලය ප්‍රයෝජනයට ගැනීම සඳහා ගැඹුරු ළිංවලින් ජලය ගෙන වගා කරති. ජල උල්පත් සහිත මෙම ක්ෂේම භූමිවල ජනයා ඒකරාශි වී ඇත.

3.12 රූපය : කාන්තාර භූ දර්ශනය

3.13 රූපය : කාන්තාරයක පිහිටි ක්ෂෙම භූමියක්

මෙම ක්ෂේම භූමි ආශ්‍රිතව උක්, කපු, මිලට් වැනි භෝග වගා කරති. සත්ත්ව පාලනය ද ප්‍රධාන ආර්ථික කටයුත්තකි. භාණ්ඩ ප්‍රවාහනයේ දී ඔටුවා යොදා ගැනේ. මිනිස්සු උෂ්ණත්වයට ඔරොත්තු දෙන කපු ඇඳුම් භාවිත කරති.

මිනිස් ක්‍රියාකාරකම් අතර අවිධිමත් ලෙස වගා කිරීම නිසා කාන්තාරය ක්‍රමයෙන් පැතිරෙන බවක් පෙනේ. මෙහි නිවාසවල පරිසරයට අනුව විවිධ වර්ණ ආලේප කර ඇත. සත්ත්ව පාලන කටයුතු සඳහා අධික ලෙස තෘණ භාවිතය නිසා භූමිය නිසරු වී ඇත.

ක්‍රියාකාරකම

01. කාන්තාර භූ දර්ශනය තුළ කැපී පෙනෙන ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

පැවරුම

01. දකුණු ආසියානු කලාපයේ ඔබ ඉගෙනගත් විවිධ භූ දර්ශනවල තොරතුරු රාශියක් පහත දක්වා ඇත. මේ සමඟ දක්වා ඇති කොටු සහිත සටහන පිටපත් කරගෙන ඒ ඒ භූ දර්ශනයට අදාළ තොරතුරු එම කොටුවල ලියා දක්වන්න.

1. විවිධ උසින් යුතු කඳු වැටි ඇත.
2. තැනිතලා ප්‍රදේශයකි.
3. තැනින් තැන ක්ෂේම භූමි ඇත.
4. විශාල වැලි වැටි පැතිර ඇත.
5. අධික ජන පීඩනයක් ඇත.
6. අඩු ආදායම් නිවාස බහුල වේ.
7. ප්‍රවාහනයේ දී ඔටුවා වැදගත් වේ.
8. දර්ශනීය කොරල්පර ඇත.
9. ධීවර කර්මාන්තය ප්‍රධාන වේ.
10. සංස්කෘතික ලක්ෂණ නොවෙනස්ව ඇත.
11. ජල සම්පාදනය මගින් කෘෂිකර්මාන්තය සිදු කෙරේ.
12. අල වර්ග, මී පැණි, දඩයම් කළ සතුන් ආහාරයට ගනි.
13. කඳු අතර තැනිතලා, නිම්න, දොරු පිහිටා ඇත.
14. ඉහළ ගංගා නිම්නයේ සිට පහළට යන විට විවිධ භෝග වගා කෙරෙයි.
15. නොදියුණු ගෝත්‍රික ජනයා වාසය කරයි.
16. වැව කේන්ද්‍ර කොටගෙන ජනාවාස විහිදී ඇත.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ආශ්‍රිත ග්‍රන්ථ සහ මූලාශ්‍ර

- ගුණසේන පිලිප් ලෝක සිතියම් පොත (2003), සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.
- http://www.freeworldmaps.net/asia/southasia/southasia-physical-map.jpg
- http://files.prokerala.com/maps/india/map-files/river-ganges-map.jpg

පාරිභාෂික වචන

• භූ දර්ශනය	Landscape	நிலத்தோற்றம்
• සාපේක්ෂ පිහිටීම	Relative location	சார்பமைவு
• නිරපේක්ෂ පිහිටීම	Absolute location	தனியமைவு
• භෞතික භූ දර්ශනය	Physical landscape	பௌதிக நிலத்தோற்றம்
• මානුෂ භූ දර්ශනය	Human landscape	மானிட நிலத்தோற்றம்
• කඳුකර භූ දර්ශනය	Mountain landscape	மலைப்பாங்கானநிலத்தோற்றம்
• නිම්න භූ දර්ශනය	Valley landscape	பள்ளத்தாக்கு நிலத்தோற்றம்
• රැළි බිම	Undulating land	தொடரலை நிலம்
• හැඩපළු ගංගාව	Braided river	பின்னிய ஆறு
• ගං දඟර	River meander	ஆற்று மியாந்தர்
• පිටාර තැනි	Flood plains	வெள்ளச்சமவெளிகள்
• වෙරළබඩ භූ දර්ශනය	Coastal landscape	கரையோர நிலத்தோற்றம்
• අතොළු	Atols	பவளப்பாறைகள்
• සංචාරක ආකර්ෂණ	Tourist attractions	சுற்றுலா பயணிகளை ஈர்க்கும்
• ග්‍රාමීය භූ දර්ශනය	Rural landscape	கிராமிய நிலத்தோற்றம்
• කාර්මික භූ දර්ශනය	Industrial landscape	கைத்தொழில் நிலத்தோற்றம்
• නාගරික භූ දර්ශනය	Urban landscape	நகர நிலத்தோற்றம்
• ක්ෂේම භූමි	Oasis	பாலைவனச் சோலை
• වනහරණය	Deforestation	காடழிப்பு

නොමිලේ බෙදාහැරීම සඳහා ය.